# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,156 — 1960 ජූලි 8 වැනි සිකුරාද — 8.7.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV වැනි කොටස – පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 139 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | 145 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපළ විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 143 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් ... ... | 145 |

## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥාපනත—198 වැනි පරිච්ඡේදය

### හංවැල්ල පේරුව ගම්ප්‍රදේශයේ ගම්කායර් සභාව

කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල පේරුව ගම්ප්‍රදේශයේ ගම්කායර් සභාව විසින් සම්මත කරණලද පහත දක්වෙන යෝජනාව මහජනයාගේ දැනගැනීම පිණිස ප්‍රසිද්ධ කරණු ලැබේ.

දොන් සුගතන් එදිරිසිංහ,
හංවැල්ල පේරුව ගම්කායර් සභාවේ සභාපති.

ගම්කායර් සභා කායර්ාලය,
හංවැල්ල, 1960 ජූනි මස 23 වැනි දින.

### යෝජනාව

1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සහා පොදු අතුරු ව්‍යවස්ථා ආඥාපනතේ 3 වෙනි වගන්තියේ 1 වෙනි උප වගන්තිය යටත් හංවැල්ල පේරුව ගම්ප්‍රදේශයේ ගම්කායර් සභාව විසින් 1953 නොවැම්බර් මස 19 වෙනි දින අංක 10,614 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරනලද යෝජනාවෙන් සම්මතකර ගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා 4 වෙනි කාණ්ඩයේ 1 වෙනි වගන්තියේ ප්‍රකාර මෙහි පහත දක්වෙන මංමාවත් එකිනෙක ඉදිරියේ සඳහන් දිග හා පළල ඇතුව සාද හෝ නැවත සාද පවත්වාගෙන යායුතුයි යෝජනා කරනලදී.

| කොට්ඨාශයේ අංකය සහ නම | පාරේ/මාවතේ අංකය සහ නම | දිග හැ. | දිග පර. | දිග දම්. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|---|---|
| 1. හංවැල්ල ඉහල ... ... | 1. පන්සල පාර ... ... ... | — | 7 | 5 | — | 16 |
| 1. හංවැල්ල ඉහල ... ... | 2. ඊරියගොල්ල පාර ... ... | — | 5 | — | — | 14 |
| 1. හංවැල්ල ඉහල ... ... | 3. තේක්කහේන පාර ... ... | 1 | 1 | 5 | — | 14 |
| 1. හංවැල්ල ඉහල ... ... | 4. බෝයිස් ටවුන් පාර ... ... | 1 | — | 2 | — | 16 |
| 1. හංවැල්ල ඉහල ... ... | 5. මධ්‍යම මහා විද්‍යාල පාර ... ... | — | 1 | 6 | 6 | 20 |
| 1. හංවැල්ල ඉහල ... ... | 6. මධ්‍යම මහා විද්‍යාල මාවත ... ... | — | 1 | 1 | 4 | 14 |

| කොට්ඨාශයේ අංකය සහ නම | පාරේ/මාවතේ අංකය සහ නම | දිග | | | | පළල |
|---|---|---|---|---|---|---|
| | | හැ. | පර. | දම්. | අඩි | අඩි |
| 1. හංවැල්ල ඉහල | 7. හංවැල්ල ඉහල සුසානභූමි පාර | — | — | 8 | — | 14 |
| 2. තුන්නාන | 8. තුන්නාන හංවැල්ල පහළ පාර | 2 | 4 | 7 | — | 18 |
| 2. තුන්නාන | 9. තුන්නාන බරාව පාර | — | 4 | — | — | 14 |
| 2. තුන්නාන | 10. තුන්නාන කුඩා කන්ද පාර | — | 4 | — | — | 14 |
| 3. මාවතගම | 11. මාවතගම රිටිගහහේන පාර | 1 | 3 | — | — | 16 |
| 3. මාවතගම | 12. මාවතගම පැල්පොලමුල්ල පාර | — | 4 | — | — | 14 |
| 3. මාවතගම | 13. මාවතගම සුසානභූමියට යන පාර | — | — | 6 | — | 16 |
| 4. හංවැල්ල පහල | 14. ගුළුහේන පාර | — | 2 | 8 | — | 14 |
| 4. හංවැල්ල පහල | 15. ගංගොඩේ පාර | — | 2 | 8 | — | 14 |
| 5. ආටිගල | 16. ආටිගල කබාමුල්ල පාර | — | 3 | 5 | — | 14 |
| 5. ආටිගල | 17. ආටිගල පන්සල පාර | — | 2 | 5 | — | 16 |
| 5. ආටිගල | 18. ආටිගල වෙල පාර | 1 | 2 | 1 | — | 16 |
| 5. ආටිගල | 19. ආටිගල නාම්ලුව පාර | — | 2 | 7 | — | 14 |
| 6. පානලුව | 20. මෝල පාර | — | 6 | 4 | — | 14 |
| 6. පානලුව | 21. පානලුව දික්හේන පාර | — | 7 | 5 | 33 | 16 |
| 6. පානලුව | 22. පානලුව සුසානභූමි පාර | — | — | 8 | — | 14 |
| 6. පානලුව | 23. මීගොඩ නඩුහේන පාර | 1 | 3 | 6 | — | 18 |
| 6. පානලුව | 24. නඩුහේන හරස්පාර | — | 2 | — | — | 20 |
| 6. පානලුව | 25. එපිටමුල්ලවත්ත රවුම් පාර | — | — | 5 | — | 16 |
| 6. පානලුව | 26. මීගොඩ සුසානභූමියට යන පාර | — | — | 4 | — | 16 |
| 6. පානලුව | 27. කටුකිතුල්දෙනිය පාර | — | 3 | 6 | — | 14 |
| 6. පානලුව | 28. මීගොඩ කන්දෙවත්තෙ පාර | — | 4 | — | — | 14 |
| 6. පානලුව | 29. අත්තනපොල පාර | — | 5 | 2 | — | 14 |
| 7. ඔව්ටිගම වටරැක | 30. කළුවලදෙනිය කජුගහයටදෙනිය පාර | 1 | 1 | 6 | — | 16 |
| 7. ඔව්ටිගම වටරැක | 31. ඔව්ටිගම පිටිපන පාර | — | 6 | 9 | — | 18 |
| 7. ඔව්ටිගම වටරැක | 32. ඔව්ටිගම සුසානභූමියට යන පාර | — | 3 | — | — | 16 |
| 7. ඔව්ටිගම වටරැක | 33. ඔව්ටිගම කුරුඳුවත්ත පාර | — | 2 | 2 | — | 14 |
| 7. ඔව්ටිගම වටරැක | 34. වටරැක ආඳාදෙල පාර | — | 4 | — | — | 14 |
| 7. ඔව්ටිගම වටරැක | 35. වටරැක පින්නලන්ද පාර | — | 5 | — | — | 16 |
| 7. ඔව්ටිගම වටරැක | 36. වටරැක ගම්මාන පාර | 1 | — | 1 | — | 16 |
| 7. ඔව්ටිගම වටරැක | 37. වටරැක ගම්මාන පාර (ශාඛාව) | — | 2 | 5 | — | 14 |
| 7. ඔව්ටිගම වටරැක | 38. වටරැක ගලබැඳිහේන පාර | — | 4 | — | 33 | 14 |
| 8. බටවල | 39. බටවල දෙවට පාර | 1 | 4 | 11 | — | 18 |
| 8. බටවල | 40. වල්පිට දෙවට පාර | 1 | 1 | 9 | 9 | 16 |
| 8. බටවල | 41. බටවල වැවේහේන පාර | — | 3 | — | 24 | 14 |
| 8. බටවල | 42. තැලුම්පිටියාගොඩ ආටිගල පාර | — | 7 | — | — | 18 |
| 8. බටවල | 43. බටවල ලබුපිටිය පාර | — | 4 | 5 | — | 14 |
| 9. ජල්තර හේන්පිට | 44. ජල්තර කැකුලන්විල පාර | 1 | 2 | 1 | 33 | 18 |
| 9. ජල්තර හේන්පිට | 45. බටේවල පාර | — | 3 | 5 | 33 | 16 |
| 9. ජල්තර හේන්පිට | 46. ජල්තර ගන්ගොඩ පාර | — | 5 | 2 | — | 14 |
| 9. ජල්තර හේන්පිට | 47. ජල්තර සුසානභූමියට යන පාර | — | 3 | 1 | — | 18 |
| 9. ජල්තර හේන්පිට | 48. හේන්පිට වෙල පාර | — | 1 | 4 | — | 14 |
| 9. ජල්තර හේන්පිට | 49. කුමාරයාගල පාර | 1 | — | 4 | — | 14 |

---

ඇල්.ජී.ඩී. ජීඊ. 14/41.

### 1952කේ අංක 6 දරණ ප්‍රදෙශාධිකාරි සභා (පොදු ආදශී අතුරු ව්‍යවසථා) ආඥාපනත

1952 කේ අංක 6 දරන ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවසථා) ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ එගොඩපොත ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්මත කරගන්නාලද පහත දක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළකරනු ලැබේ.

#### යෝජනාව

ප්‍රදේශ පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද්දාවූද, සෙනේට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව වර්ෂ 1953ක්වූ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 10 වෙනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට එගොඩපොත ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් 1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවසථා) ආඥාපනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

ජේ. පී. වීරසිංහ
එගොඩපොත ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාවේ ප්‍රධාන තුමා.

වර්ෂ 1960 ක්වූ අප්‍රියෙල් මස 8 වැනි දින,
නිට්ටඹුව-ගම්කාර්ය සභා කාර්යාලයේදීය.

## ගම් සභා ආඥපනත (198 වැනි පරිච්ඡේදය)

### කුරුවිටි කෝරළේ පල්ලේපත්තු ගම් ප්‍රදේශයේ ගම්කායභා් සභාව

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ පල්ලේ පත්තු ගම්ප්‍රදේශයේ ගම්කායභා් සභාව විසින් 60.5.28 දින රැස්වීමේදී සම්මත කර ගන්නාලද පහත සඳහන් යෝජනාව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ගම්කායභා් සභා කායභා්ලය,
ඇහැලියගොඩ,
1960.6.10

ජී. එච්. පොඩියා,
සභාපති.

### යෝජනාව

ගම්සභා පාරවල්

1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥපනතේ 3 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ කුරුවිටි කෝරළේ පල්ලේ පත්තු ගම් ප්‍රදේශයේ ගම්කායභා් සභාව විසින් 1954ක්වූ දෙසැම්බර මස 10 වැනි දින අංක 10,743 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරනලද යෝජනා වෙන් සම්මත කර ගන්නාලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල IV වැනි කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග හා පළල අනුව සාද හෝ නැවත සාද පවත්වාගෙන යාමට මෙයින් සම්මත කරනු ලැබේ :—

| අංකය | පාරේ නම | කරත්ත පාර දිග ප්‍රමාණය හැ. | කරත්ත පාර දිග ප්‍රමාණය ද. | කරත්ත පාර පළල අඩි | අඩි පාර දිග ප්‍රමාණය හැ. | අඩි පාර දිග ප්‍රමාණය ද. | අඩි පාර පළල අඩි |
|---|---|---|---|---|---|---|---|
| | **අංක 1—කැන්දන්ගමුව ඉහලගම කොට්ඨාශය** | | | | | | |
| 1. | පැල්පිටිය–ගමමැද පාර | — | 20 | 16 | — | 60 | 8 |
| 2. | මෝරාගල–බුළුගහපිටිය පාර | 1 | 16 | 16 | — | — | — |
| 3. | ටවුම–නාගහ පාර | — | 62 | 16 | — | — | — |
| 4. | ටවුම–යෝදගංගොඩ පාර | — | 10 | 16 | — | 15 | 8 |
| 5. | කොත්විල–නාගහ පාර | — | 20 | 16 | — | — | — |
| 6. | මැලේරියා පාර | 1 | 29 | 16 | — | — | — |
| 7. | ඇහැලියගොඩ–පරණ පොලිසිය පාර | — | 10 | 16 | — | — | — |
| 8. | මෝරාගල–පැල්පිටිය පාර (වත්තේකන්ද කඳුමැංඩිය මැදින් පැල්පිටිය ගමමැද පාරට වැටෙන පාර) | — | — | — | — | 60 | 8 |
| 9. | මෝරාගල–කැලපතනවත්ත පාර | — | — | — | — | 60 | 8 |
| 10. | කොත්විල නාශහ පාර–කොත්විල ගම පාර | — | — | — | — | 30 | 8 |
| 11. | ටවුම නාගහ පාර–අංකෙලිපොත්ත පාර (කොට්ටගස්වත්ත මැදින්) | — | — | — | — | 40 | 8 |
| | **අංක 2—තොරණකඩ කොට්ඨාශය** | | | | | | |
| 12. | තොරණගොඩ–පූවාදෙනිය පාර | — | 43 | 16 | — | 33 | 8 |
| 13. | උඩුමත්ත–බෝපැත්ත පාර | — | 20 | 16 | — | 66 | 8 |
| 14. | ගලඋඩඅම්බලම–පූවාදෙනිය පාර | — | — | — | — | 68 | 8 |
| 15. | තොරණගොඩ–විලේගොඩ පාර (බෙරුවාන මැදින් විලේගොඩ–වෙලන්ගල්ල පාර දක්වා) | — | — | — | 1 | — | 8 |
| 16. | ගල්පොල–බෙරුවාන පාර | — | — | — | — | 60 | 8 |
| 17. | ඕවිට–විලේගොඩ පාර | — | — | — | — | 60 | 8 |
| | **අංක 3—විලේගොඩ කොට්ඨාශය** | | | | | | |
| 18. | අංකෙලිපොත්ත–කොට්ටගස්වත්ත පාර | — | — | — | — | 36 | 8 |
| 19. | විලේගොඩ–වෙලන්ගල්ල පාර | 3 | 49 | 16 | — | — | — |
| 20. | නුගේගාවහේන–අංකෙලිපොත්ත පාර (වඩුගංගොඩ මැදින්) | — | — | — | — | 60 | 8 |
| 21. | කොට්ටගස්වත්ත–අංකෙලිපොත්ත පාර | — | — | — | — | 40 | 8 |
| 22. | ප්‍රසිද්ධ පාරේ සිට විලේගොඩ වෙලන්ගල්ල පාර දක්වා ඇති පාර | — | — | — | — | 10 | 8 |
| 23. | ටවුම නාගහ පාරේ සිට මල්මුතුවාගෙවත්ත දක්වා ඇති පාර | — | — | — | — | 20 | 8 |
| 24. | විලකොලදෙනිය–හොරගොඩ ඇල පාර | — | — | — | — | 60 | 8 |
| 25. | එගොඩවත්ත–මල්මුතුවාගෙවත්ත පාර | — | — | — | — | 40 | 8 |
| | **අංක 4—මින්නාන කොට්ඨාශය** | | | | | | |
| 26. | මින්නාන–නාගොඩ පාර | — | 20 | 16 | — | — | — |
| 27. | නාගොඩ–දිද්ද පාර | — | 20 | 16 | — | 30 | 8 |
| 28. | විලේගොඩ වෙලන්ගල්ල පාරේ සිට රන්ගෙගම දක්වා ඇති පාර (අරඹවත්ත මැදින්) | — | — | — | 1 | 40 | 8 |
| 29. | ඇපලෙහේනෙවත්ත–දිද්ද පාර (විලේගොඩ–වෙලන්ගල්ල පාර දක්වා) | — | — | — | — | 60 | 8 |
| 30. | කොහිලදෙනියේ සිට විලේගොඩ වෙලන්ගල්ල පාර දක්වා ඇති පාර (කැටඋදුරනහේන මැදින්) | — | — | — | — | 40 | 8 |
| | **අංක 5—ගැටහැත්ත කොට්ඨාශය** | | | | | | |
| 31. | දිවුරුම්පිටිය–වෙලන්ගල්ල පාර | — | 68 | 16 | — | — | — |
| 32. | බෙලෙක්කඩේ–වෙලන්ගල්ල පාර | — | — | — | — | 40 | 8 |
| 33. | ගැටහැත්තේ පිරිමි පාසලට යන පාර | — | 20 | 16 | — | — | — |
| 34. | ගැටහැත්තේ පාලම–වෙලන්ගල්ල පාර | — | — | — | — | 60 | 8 |
| 35. | වලව්ට පාරේ සිට ගැටහැත්තේ හිරිකුඹුර දක්වා ඇති පාර | — | — | — | — | 40 | 8 |
| 36. | නාගොඩ පාරේ සිට ගැටහැත්තේ හිරිකුඹුර දක්වා ඇති පාර | — | — | — | — | 60 | 8 |
| | **අංක 6—වලව්ට කොට්ඨාශය** | | | | | | |
| 37. | පොල්වත්තකඩේ–වලව්ට පාර | — | 47 | 16 | — | 44 | 8 |
| 38. | වලව්ට–මුරුතැන්ගල පාර | — | — | — | — | 47 | 8 |
| 39. | පොල්වත්තකඩේ–ඉළුප්පිටිය පාර | — | 20 | 16 | — | 20 | 8 |
| 40. | පොල්වත්තකඩේ වලව්ට පාරේ සිට ගනේගොඩ ගම්මැංඩිය දක්වා ඇති පාර | — | — | — | 1 | — | 8 |
| 41. | වලව්ට මුරුතැන්ගල පාරේ සිට මුරුතැන්ගල ගම්මැංඩිය හරහා ඇති පාර | — | — | — | — | 40 | 8 |
| 42. | වලව්ට පාරේ සිට කලටුවාව ප්‍රසිද්ධ පාර දක්වා ඇති පාර | — | — | — | — | 40 | 8 |

| අංකය | පාරේ නම | කරත්ත පාර දිග ප්‍රමාණය හැ. | ද. | පළල අඩි | අඩි පාර දිග ප්‍රමාණය හැ. | ද. | පළල අඩි |
|---|---|---|---|---|---|---|---|
| | **අංක 7—අමුපිටිය කොට්ඨාශය** | | | | | | |
| 43. | ඉද්දමල්ගොඩ–මෝරාගල පාර | — | 40 | 16 | — | 65 | 8 |
| 44. | අමුපිටිය–ගමමැද පාර | — | — | — | 1 | 04 | 8 |
| 45. | ඇල්ලගාව පාර | — | — | — | — | 47 | 8 |
| 46. | ඉද්දමල්ගොඩ–පූවාදෙනිය පාර | — | — | — | — | 44 | 8 |
| 47. | මුල්ලක්කඩ සිට ගනේගොඩ අමුපිටිය ගමමැද පාර දක්වා ඇති පාර | — | — | — | — | 20 | 8 |
| 48. | ඇල්ලලහ සිට අමුපිටිය හරහා ඇති පාර | — | — | — | 1 | 20 | 8 |
| 49. | සොම්සඳවත්ත–ගලකොන පාර | — | — | — | 1 | 20 | 8 |
| 50. | අම්බලමවත්ත–උක්කිරිගල පාර | — | — | — | 1 | — | 8 |
| 51. | නුගේහැරුස්ස–ගලකොන පාර | — | — | — | — | 60 | 8 |
| 52. | අමුපිටිය ගමමැද පාරේ සිට ගනේගොඩ කන්ද දක්වා ඇති පාර | — | — | — | 1 | — | 8 |
| | **අංක 8—ඉද්දමල්ගොඩ කොට්ඨාශය** | | | | | | |
| 53. | හුලද්දුව–ගොරකදෙනිය පාර | — | — | — | — | 44 | 8 |
| 54. | ඉද්දමල්ගොඩ–මීටිපොල පාර | 1 | — | 16 | — | 30 | 8 |
| 55. | ඉද්දමල්ගොඩ–පහල ඇල්ල පාර | — | — | — | — | 40 | 8 |
| 56. | ඉද්දමල්ගොඩ–ඉළුප්පිටිය පාර | — | — | — | — | 60 | 8 |
| 57. | ඉද්දමල්ගොඩ–මීටිපොල පාර | — | — | — | 1 | — | 8 |
| 58. | හුලද්දුවවාඩියවත්ත–එගොඩවත්ත පාර | — | — | — | 1 | 40 | 8 |
| | **අංක 9—නාපාවල කොට්ඨාශය** | | | | | | |
| 59. | නාපාවල–පොද්දෙනිය පාර | — | — | — | 1 | — | 8 |
| 60. | පොද්දෙනිය–නාපාවල පාර | — | — | — | — | 60 | 8 |
| 61. | නාපාවල පංසල මීනීමරුවළගාවවත්ත පාර | — | — | — | — | 60 | 8 |
| 62. | නාපාවල පංසල්වත්ත–ගල්වලේවත්ත පාර | — | — | — | 1 | — | 8 |
| 63. | උඩුවක තුන්මන් හංදිය–මියනකොලතැන්නේ පහලවත්ත පාර | — | — | — | 1 | — | 8 |
| 64. | මහදෙනිය–උඩුවක පාර (උඩුවකකන්ද හරහා) | — | — | — | 2 | — | 8 |
| 65. | නාපාවල හීනවත්ත–වැව්තැන්න පාර | — | — | — | 1 | — | 8 |
| 66. | උඩුවක–මාරඹකන්දවත්ත පාර | — | — | — | 1 | 20 | 8 |
| | **අංක 10—කලටුවා කොට්ඨාශය** | | | | | | |
| 67. | කලටුවාකන්ද පාර | — | — | — | 2 | 10 | 8 |
| 68. | මැල්බෝන්වත්තේ සිට කලටුවා කන්ද පාර දක්වා ඇති පාර | — | — | — | — | 60 | 8 |
| 69. | වගවත්තේ සිට කලටුවාකන්ද පාර දක්වා ඇති පාර | — | — | — | 1 | — | 8 |
| 70. | පොල්වත්තේ සිට කලටුවාකන්ද පාර හරහා කුම්මෝදර ප්‍රසිද්ධ පාර දක්වා ඇති පාර | — | — | — | 1 | 20 | 8 |
| 71. | නුගේතැන්න–කලටුවාකන්ද පාර | — | — | — | — | 60 | 8 |
| 72. | හේවායින්නේකන්ද–කලටුවාකන්ද පාර | — | — | — | 1 | — | 8 |
| 73. | පාතකෝරලේ වත්තේ සිට කලටුවාකන්ද පාර දක්වා ඇති පාර | — | — | — | 1 | 20 | 8 |
| 74. | දෙහිගස්ඇල්ලේ සිට කලටුවාකන්ද පාර දක්වා ඇති පාර | — | — | — | 1 | — | 8 |
| 75. | මිදිගහවල ලඟ සිට කලටුවාව පාර දක්වා ඇති පාර | — | — | — | 1 | — | 8 |
| 76. | පොල්කොටුවේ සිට කලටුවාකන්ද පාර දක්වා ඇති පාර | — | — | — | 1 | — | 8 |
| | **අංක 11—මාපොට කොට්ඨාශය** | | | | | | |
| 77. | මාපොට–මීටිපොල පාර | — | — | — | — | 77 | 8 |
| 78. | මාපොට මීටිපොල පාරේ සිට කරඳන දක්වා ඇති පාර | — | — | — | — | 60 | 8 |
| 79. | මාපොට ප්‍රසිද්ධ පාරේ සිට මාපොට ගම දක්වා ඇති පාර | — | — | — | — | 27 | 8 |
| 80. | මාපොට පාර | — | 3 | 16 | — | — | — |
| | **අංක 12—ඉලුප්පිටිය කොට්ඨාශය** | | | | | | |
| 81. | මාරඹේ–ඉද්දමල්ගොඩ පාර | — | 40 | 16 | — | 52 | 8 |
| 82. | මාරඹේ–කළුඅඳුර පාර | — | 20 | 16 | — | 64 | 8 |
| 83. | මාරඹේ–දෙයියාගල පාර | — | — | — | — | 40 | 8 |
| 84. | ගනේවිල–වලව්ටවත්ත පාර | — | — | — | — | 53 | 8 |
| 85. | මාරඹේ දෙයියාගල පාරේ සිට මරඹකන්ද දක්වා ඇති පාර (දෙයියාගල මීටියාවත හරහා) | — | — | — | — | 40 | 8 |
| 86. | මාරඹේ ඉද්දමල්ගොඩ පාරේ සිට පොල්වත්තකඩේ වලව්ට පාර දක්වා ඉළුප්පිටිය ගම මැදින් ඇති පාර | — | — | — | — | 60 | 8 |
| 87. | මාරඹේ ඉද්දමල්ගොඩ පාරේ සිට හුලද්දුකන්ද හරහා ජඹුරදෙනිය වත්ත දක්වා ඇති පාර | — | — | — | — | 40 | 8 |
| 88. | හීනටිදෙනියේ සිට හේවයින්නේකන්ද ගම මැදින් බටහිර කලටුවාව දක්වා ඇති පාර | — | — | — | — | 60 | 8 |
| | **අංක 13—මාරඹකන්ද කොට්ඨාශය** | | | | | | |
| 89. | මාරඹේ–මාරඹකන්ද පාර | — | 3 | 16 | — | 70 | 8 |
| 90. | මාරඹේ මාරඹකන්ද පාරේ සිට බාලයාගේ වත්ත දක්වා ඇති පාර | — | — | — | 1 | — | 8 |
| 91. | දෙයියාගල ඕව්ටේවත්ත–බාලයාගේවත්ත පාර | — | — | — | — | 40 | 8 |
| 92. | දෙයියාගල පිලෝරිසාගෙ වත්ත–හුලද්දුව පාර | — | — | — | 1 | 20 | 8 |
| 93. | ඇත්ගාල–කලුගල ඇල්ල පාර | — | — | — | 1 | — | 8 |
| 94. | කළු අඳුරේ කිරිපලුගහවත්තේ සිට කළු අඳුර වත්ත පාර දක්වා ඇති පාර | — | — | — | — | 40 | 8 |
| 95. | කළුඅඳුර පාර–කළුඅඳුර විහාරය පාර | — | — | — | — | 20 | 8 |
| 96. | හීනටිදෙනියේ සිට කලටුවාකන්ද පාර දක්වා ඇති පාර | — | — | — | 2 | — | 8 |
| 97. | මාරඹේ ගංහතර වත්ත–හුලද්දුකන්ද පාර | — | | — | 1 | — | 8 |
| 98. | පබිලිස්ගෙ ගේ ලඟ සිට මාරඹකන්ද පුවක්පිටිය ප්‍රසිද්ධ පාර දක්වා ඇති පාර | — | — | — | — | 20 | 8 |
| | **අංක 14—දන්කුඹුර කොට්ඨාශය** | | | | | | |
| 99. | පලිගල–බඩහැල පාර | 1 | 05 | 16 | — | — | — |
| 100. | ඇහැලියගොඩ–කිරිඇල්ල පාර | 1 | 45 | 16 | — | — | — |
| 101. | ඇහැලියගොඩ කිරිඇල්ල පාරේ සිට කෝට්ටගොඩ ගම්මැන්ඩිය දක්වා ඇති පාර | — | — | — | — | 40 | 8 |
| 102. | ඇහැලියගොඩ කිරිඇල්ල පාරේ සිට පහලගම හරහා පලිගල බඩහැල පාර දක්වා ඇති පාර | — | — | — | — | 40 | 8 |
| 103. | පලිගල බඩහැල පාරේ සිට බොරලුවේ මූකලාන දක්වා ඇති පාර | — | — | — | 1 | — | 8 |
| 104. | මැලේරියා පාරේ සිට දන්කුඹුර ගම්මැන්ඩිය දක්වා ඇති පාර | | — | — | 1 | — | 8 |

| අංකය | පාරේ නම | කරත්ත පාර දිග ප්‍රමාණය හැ. | කරත්ත පාර දිග ප්‍රමාණය ද. | කරත්ත පාර පළල අඩි | අඩි පාර දිග ප්‍රමාණය හැ. | අඩි පාර දිග ප්‍රමාණය ද. | අඩි පාර පළල අඩි |
|---|---|---|---|---|---|---|---|
| | **අංක 15—තිබ්බොටුවාව කොට්ඨාශය** | | | | | | |
| 105. | කැකුණමලේ–පිටවත්ත පාර | — | 71 | 16 | — | — | — |
| 106. | මාහින්ගොඩ–මාහර පාර | — | 24 | 16 | — | — | — |
| 107. | මාහින්ගොඩ–වියලගොඩ පාර | 1 | 25 | 16 | — | — | — |
| 108. | තිබ්බොටුවාව–නාකන්දල පාර | — | 75 | 16 | — | — | — |
| 109. | ඇහැලියගොඩ කිරිඇල්ල පාරේ සිට බෝගහපිට්ටනිය හරහා කැකුණමලේ පිටවත්ත පාර දක්වා ඇති පාර | — | — | — | — | 40 | 8 |
| 110. | ඇහැලියගොඩ කිරිඇල්ල පාරේ සිට කොට්ටගස්වත්ත හරහා කැකුණමලේ පිටවත්ත පාර දක්වා ඇති පාර | — | — | — | — | 20 | 8 |
| 111. | කැකුණමලේ පිටවත්ත පාරේ සිට තිබ්බොටුවා හරහා මාහින්ගොඩ නාකන්දල පාර දක්වා ඇති පාර | — | — | — | — | 60 | 8 |
| 112. | ඇහැලියගොඩ කිරිඇල්ල පාරේ සිට මැදපිටිය හරහා මාහින්ගොඩ නාකන්දල පාර දක්වා ඇති පාර | — | — | — | — | 60 | 8 |
| 113. | වියලගොඩ දුම්රිය පාරේ සිට වැකේ ගම දක්වා ඇති පාර | — | — | — | — | 60 | 8 |
| | **අංක 16—පලීගල කොට්ඨාශය** | | | | | | |
| 114. | නාකන්දල–එල්ලාවල පාර | 1 | — | 16 | — | 10 | 8 |
| 115. | ඇහැලියගොඩ–මිටිපොල පාර | 2 | 55 | 16 | — | — | — |
| 116. | ඇහැලියගොඩ මිටිපොල පාරේ සිට මියනකොලතැන්න හරහා මිටිපොල දක්වා ඇති පාර | — | — | — | 1 | — | 8 |
| 117. | පොද්දෙනියේ දොල–මිටිපොල පාර | — | — | — | 1 | — | 8 |
| 118. | ඇහැලියගොඩ මිටිපොල පාරේ අඹගස්තැන්නේ සිට මිටිපොල දක්වා ඇති පාර | — | — | — | 1 | — | 8 |
| 119. | පලීගල බඩහැල පාරේ පංසල්වත්තේ සිට බොරලුවේ මූකලාන දක්වා ඇති පාර | — | — | — | — | 60 | 8 |
| 120. | ඇහැලියගොඩ මිටිපොල පාරේ ගොරකයවත්තේ සිට කොන්ඩගලහේන දක්වා ඇති පාර | — | — | — | 1 | — | 8 |
| | **අංක 17—බුලුගහපිටිය කොට්ඨාශය** | | | | | | |
| 121. | ඇහැලියගොඩ මිටිපොල පාරේ සිට මෝරාගල බුලුගහපිටිය පාරේ කොස්වත්තේ ඇල දක්වා ඇති පාර | — | — | — | 1 | — | 8 |
| | එකතුව | 23 | 00 | | 80 | 76 | |

# අතුරු ව්‍යවස්ථා

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෑදුකෝරළයේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 ජූනි මස 27 වැනි දින,
කොළඹදීය.

**අප්‍රසන්න වූ හා අන්තරාදායක කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

1. පහත දක්වෙන කර්මාන්ත අප්‍රසන්න වූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(ඒ) ජාඩි හෝ කරවල ගබඩා කිරීම
(බී) තොග ගණනේ විකිණීම පිණිස නරක් විය හැකි ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
(සී) කොම්පෝස්ට් නොහොත් කෘත්‍රිම පොහොර සෑදීම.
(ඩී) විනා කිරි සෑදීම.
(ඊ) සබන් සෑදීම.
(එෆ්) දුම්කොළ වියළීම හෝ සකස් කිරීම.
(ජී) හම් පදම් කරන ස්ථානයක් තබා ගැනීම.
(එච්) පුවක් වේලා සකස් කිරීම
(අයි) සතුන්ගේ ලේ හෝ මළකුණු හෝ උනු කිරීම.
(ජේ) සතුන් ගේ ඇටකටු ගබඩා කිරීම.
(කේ) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හෝ සෑදීම.
(ඇල්) කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය හෝ ගෝනි තුනකට වඩා ගබඩා කිරීම.
(ඇම්) කෝඩා සෑදීම.
(ඇන්) ලෑලි පොඟවා සකස් කිරීම.
(ඕ) මාළු අයිස් දැමීම.
(පී) සුරුට්ටු සිගරැට් හෝ බීඩි සෑදීම.
(කිව්) පැනි හෝ හකුරු සෑදීම.

2. පහත සඳහන් කර්මාන්ත අන්තරාදායක කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(ඒ) වඩුමඩුවක් තබා ගැනීම.
(බී) කොප්පරා සෑදීම.
(සී) තෙල්වලින් හෝ වාෂ්ප බලයෙන් හෝ පැට්රල් ආදී දැවෙන ද්‍රව්‍ය වලින් හෝ ඉලෙක්ට්‍රික් බලයෙන් හෝ ක්‍රියා කරනා යන්ත්‍ර පාවිච්චි කරන යම් කර්මාන්තයක්.
(ඩී) කබුක් ගල්, බොරළු, කලුගල් ලබා ගැනීමට වලවල් කැනීම හෝ වලවල් තබා ගැනීම.
(ඊ) මිනිරන් වියළීම හෝ ගබඩා කිරීම.
(ඇෆ්) වළක් කැනීමෙන් හුණුගල් ලබා ගැනීම.
(ජී) හාල් හෝ වී මෝලක් තබා ගැනීම.
(එච්) යන්ත්‍ර සූත්‍ර ආදියෙන් පොල්තෙල් සිඳීම.
(අයි) සෙක්කුවකින් පොල්තෙල් සිඳීම.
(ජේ) දර හෝ ලී මඩුවක් තබා ගැනීම.
(කේ) කෙඳි වර්ග නෙලීම හෝ ගබඩා කිරීම.
(ඇල්) කපු පුළුන්, නූල් හෝ පිදුරු ගබඩා කිරීම.
(ඇම්) භූමි තෙල් ගබඩාවක් තබා ගැනීම.
(ඇන්) මුද්‍රණාලයක් තබා ගැනීම.
(ඕ) කපාපු පොල් සකස් කිරීම.
(පී) ස්වර්ණාභරණ සෑදීම.
(කිව්) අම්ලකර වායුව පාවිච්චි කරන ලෝකුරු වැඩ කිරීම.
(ආර්) අම්ලකර වායුව පාවිච්චි කරන ගරාජයක් තබා ගැනීම.
(ඇස්) කොප්පරා ගබඩා කිරීම.
(ටී) පොල්කටු අඟුරු ගබඩා කිරීම.
(යූ) කම්හලක් තබා ගැනීම.

3. පහත දක්වෙන කර්මාන්ත අන්තරාදායක හා අප්‍රසන්න වූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(ඒ) කෙඳි වර්ග සායම් කිරීම.
(බී) ගඩොල් හෝ උළු පිච්චීම.
(සී) බැටරි චාර්ජ් කිරීම.
(ඩී) අඟුරු සඳහා පොල්කටු පිච්චීම.
(ඊ) හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබැලි කිරීම.

L. G. D.—GC 14/62.

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡෙදයේ) 49 වැනි වගන්තිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ උඩඩියන් කුලම කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 ජූනි මස 27 වැනි දින,
කොළඹදීය.

### රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

1. (1) ආඥපනතේ 47 වැනි වගන්තිය යටතේ අය කරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත් වූ යම් රථවාහනයක් හෝ සතකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛනයෙහි දක්වෙන පෝර්මයේ ප්‍රකාර විස්තර උපලේඛනයක් ප්‍රධාන තුමාට සැපයිය යුතුයි. මේ පෝර්ම ගම්කාර්ය සභා කාර්යාලයෙන් ලබා ගත හැකිය.

(2) ආඥපනතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1961 වර්ෂය වෙනුවෙන් (1) ඡේදයේ සඳහන් උපලේඛනය සම්පූර්ණ කොට 1961කේ පෙබරවාරි 15 වැනි දිනට හෝ ඊට මත්තෙන් ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබා ගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අයගෙන් එබඳු උපලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම තව දුරටත් දැනුම් දෙනු ලැබීමක් නැතිව—

(අ) උපලේඛනයේ සඳහන් රථවාහන හා සතුන් සඳහාවූ බද්ද 1961 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු මස 31 වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති. තවද,

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් කරන ලදුව එකී වර්ෂයේ දවස් තිහකට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහාවූ බද්ද එකී එක් එක් අවුරුද්දේ මාර්තු මස 31 වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාට පසු යම් කිසිවෙකු විසින් ඒ උපලේඛනයෙහි සඳහන් නොකරන ලද්දාවූද, ආඥපනත යටතේ බද්දට යටත්වූද, යම් රථවාහනයක් හෝ සතකු අත්පත් කරගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම්, එක්කෝ ඉහතින් සඳහන් 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලෙඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවකු විසින් එකී බද්දට යටත් යම් රථ වාහනයක් හෝ සතකු පළමුවෙන් අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු යම් රථ වාහනයක් හෝ සතකු අත්පත් කර ගැනීමේ හෝ තබා ගැනීමට නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මීට යාකොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් පෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ලකින්වූ දැන්වීමකින් එසේ අත්පත් කරගත් බව ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන්ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛනයෙහි සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් සඳහාවූ බද්ද ඒ සඳහා ප්‍රධානතුමා විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාල සීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළාවූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතකු සම්බන්ධයෙන්වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතුන් නිසා යයි දක්වෙන ලියවිල්ලකින්වූ දැන්වීමක් වහාම ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි.

(2) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ රථවාහන හෝ සතුන් තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින්වූ දැන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත් හළ බව වහාම ප්‍රධාන තුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. යම් කිසිවෙකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධාන තුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහන වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් උපලේඛන යෙහි "බී" පෝර්මයේ ප්‍රකාරයට ඒ ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශෙෂ අකුරු තහඩුද නිකුත් කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම්ද රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථ වාහනය පිළිබඳවූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙන යම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් එය ප්‍රධාන තුමාට ආපසු භාර දිය යුතුයි. තවද ඔහු විසින් ශත පණහක් ගෙවූ විට ඔහුට අළුත් තහඩුවක් ලබා ගැනීමට අයිතිවාසිකම තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරා ගෙන තිබෙන බැව් දිවුරුම් සහතිකයක් හෝ වෙන යම් ලෙසකින් ප්‍රධාන තුමාට ඒත්තු ගැනීමට සැලැස්සුව හොත් එතුමා විසින් අයිති කාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත හැටක් ගෙවනු ලැබූ විටත් අළුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

7. සෑම රථවාහන අයිතිකරු විසින් හෝ භාරකරු විසින්ම 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවි කළ යුතුයි.

8. ප්‍රධානතුමා විසින් හෝ එතුමාගේ ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම පොලිස් නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනා ගමනයෙහි යෙදී තිබෙන රථ වාහනයක්, ඒ රථවාහනයෙහි, 7 වැනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර සවි කොට තිබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද ප්‍රධාන තුමා විසින් හෝ එකී නිලධාරියා විසින් ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම වාහනයක භාරකාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් ඒ රථය නවත්වා ප්‍රධාන තුමාට හෝ එකී නිලධාරියාට හෝ එකී තහඩුව පරීක්ෂා කර බැලීමට ඉඩ දිය යුතුයි.

9. ගම්කාර්ය සභාව විසින් සම්පාදනය කරනු ලැබ, 1941 ඔක්තෝබර් මස 3 වැනි දින අංක 8,798 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු කර සිටිනු ලැබේ.

10. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධාන තුමා" යනුවෙන් කාර්ය සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ.

"කාර්ය සභාව" යනුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ උඩඩියන් කුලම කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

"ආඥපනත" යනුවෙන් ගම්සභා ආඥපනත (198 වැනි පරිච්ඡෙදය) අදහස් කරනු ලැබේ.

### "ඒ" උපලේඛනය

**පෝර්මය**

**උඩඩියන් කුලම කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව**

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයිය යුතු රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නම :————.

ඡන්දදායක කොට්ඨාශයේ අංකය :————.

ගම :————.

| රථවාහන හා* සතුන් පිළිබඳ විස්තර | ගණන වචන වලින් | වෙනත් විස්තර |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ රථ හැර ඕනෑම අන් දමක වාහනයකට ... ... | | |
| ඕනෑම අන් දමක ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල ... | | |
| තනි ගොනා බඳින බරබාග කරත්ත හෝ තිරික්කල ... ... | | |
| අත් කරත්ත ... ... | | |
| ජින් රික්ෂෝ රථ ... ... | | |
| බයිසිකල් (වෙනත් විස්තර සඳහා සැපයුන කොටසේ සාදන ලද අයගේ නොම්මරය සඳහන් කරනු) ... | | |
| අලි ... ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

ඉහත සඳහන් විස්තරය සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

දිනය :————.

————

අයිතිකාරයාගේ අත්සන.

* නුවුවමනා වචන කපා හරිනු.

### "බී" උපලේඛනය

කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ කරත්තයක් හැර වෙන ඕනෑම අන් දමක වාහනයක් සඳහා ... ... ... උඞ්. වා.

සෑම ගොන් දෙන්නා බඳින ලද බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... උඞ්. දෙ. ක.

සෑම තනි ගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... උඞ්. ත. ක.

සෑම බයිසිකලයක් සඳහා ... ... උඞ්. බ.

සෑම අත්කරත්තයක් සඳහා ... ... උඞ්.අ.ක.

සෑම ජින් රික්ෂෝ කරත්තයකටම ... ... උඞ්. ජින්.

## අය-වැය ලේඛන

### මොරටුව නගර සභාව

**මුදල් නීති සංග්‍රහයේ අංක 12 යටතේ කරන ඉල්ලීමයි**

අය වැය ලේඛනය —1960

පහත දැක්වෙන ඉතිරි මුදල් යටතේ සඳහන් ශීර්ෂයේ මුදල ඒ හා සමඟ දැක්වෙන වැඩිපුර වියදම් යටතේ සඳහන් ශීර්ෂයෙන් වැය කිරීම සඳහා 1960.6.22 දින අංක 1 දරණ යෝජනාවෙන් නගර සභා අනුමතිය ලබා ගන්නා ලදී.

ඉතිරි මුදල්

| වැය ශීර්ෂ | | රු. | ශ. |
|---|---|---|---|
| බී—මහාමාර්ග : | | | |
| 13. ජීවනාධාර | ... ... | 10,000 | 0 |

වැඩිපුර වියදම්

| | | | |
|---|---|---|---|
| ඒ—සාමාන්‍ය වියදම : | | | |
| 4. දීමනා හා ආධාර | ... ... | 10,000 | 0 |

එච්. ඩබ්ලිව්. ස්ටැන්ලි ප්‍රනාන්දු,
නගර සභාපති.

1960.6.29 වැනි දින,
මොරටුව නගර සභා කාර්යාලයේදී.

## විවිධ දැන්වීම්

### පිස්සු බලු ආඥාපනත

නාගරිකසභා මායිම් ඇතුලතවූ මුළු කොළඹ නගරයම පිස්සු බල්ලන් සිටින නොහොත් පිස්සු බල්ලන්ගෙන් අනතුරු තිබෙන ප්‍රදේශයක් බව මෙයින් ප්‍රකාශ කරමි.

බැඳ නොතැබූ නැතහොත් බැඳ ගෙනයනු නොලබන බල්ලෙකු යම් ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරකදී සම්භවුවහොත් ඌ විනාශකර දමනු ලැබේ.

පිස්සු බල්ලන් සපාකෑමෙන් සෑදෙන ලෙඩ වලකන බෙහෙත් මැගසින් රෝඩ්හි පිස්සුබලු ස්ප්‍රිතාලයේදී නොමිලයේ විදිනු ලැබේ.

බී. ඒ. ජයසිංහ,
නාගරික කොමසාරිස් තුමා.
කොළඹ.

1.7.1960
කොළඹ නගර ශාලාවේදීය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.